# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | ඉතිහාසය | ඒකකය : පසු කාලීන පාලන මධ්‍යස්ථාන |
|---|---|---|

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පැවති ප්‍රදේශ සඳහන් කරන්න.
1. රජරට 2. නිරිතදිග 3. ඌව

(2) ක්‍රි.ව. 1215 දී බිඳවැටුණ රාජධානිය වන්නේ
1. මහනුවර 2. කෝට්ටේ 3. පොලොන්නරුව

(3) ක්‍රි.ව. 1215 සිදුවූ ආක්‍රමණයේ ද්‍රවිඩ නායකයන් වූයේ
1. මාඝ රජු 2. රාජ රාජ රජු 3. සංකිලි රජු

(4) පොලොන්නරුව 1215 චෝලයන්ට යටත් වන විට එහි රජ වූයේ
1. මිහිඳු රජු 2. පරාක්‍රම පාණ්ඩ්‍ය 3. සුභ සෙනෙවි

(5) මිනිපේ යාපහුව හා ගෝවින්ද මලය බලකොටුව නගා රට ආරම්භ කළ සෙනෙවිවරු පිළිවෙලින්
1. බුවනෙකබාහු, සංඛ, සුභ 2. සංඛ, සුභ, බුවනෙකබාහු
3. සංඛ, බුවනෙකබාහු, සුභ

(6) දඹදෙනිය රාජධානිය ආරම්භකයා වන්නේ
1. තුන්වන විජයබාහු රජු 2. දෙවන පරාක්‍රමබාහු රජු
3. ආදිපාද කස්සප රජු

(7) තුන්වන විජයබාහු රජුගේ ඉදිකිරීමක් වූ දළදා මාලිගය පිහිටි ප්‍රදේශය,
1) මහනුවර 2) බෙලිගල 3) ගම්පොළ

(8) කව් සිළුමිණ රචනා කලේ,
1) වීදාගම හිමි 2) පැරකුම්බා රජු 3) ගුරුළුගෝමීන්

(9) කලිකාල සාහිත්‍ය සර්වඥ පන්ඩිත යනු,
1) IV පැරකුම්බා රජු 2) II පැරකුම්බා රජු 3) මහා පැරකුම්බා රජු

(10) පෘතුගීසි සමයේ යාපනයේ පාලකයා වූයේ,
1) සංකිලි රජු 2) සපුමල් කුමරු 3) කුලංගෙ චක්‍රවර්ති

- **කෙටි පිළිතුරු ලියන්න.**

1) රජරට රාජධානි පිරිහීමට හේතු 3 ලියන්න.
2) රාජධානි නිරිත දෙස බිහිවීමට හේතුවූ කරුණු 3 ලියන්න.
3) දඹදෙණිය රාජධානි සමයේ ලංකාව බෙදී තිබූ ප්‍රධාන කොටස් තුන නම් කරන්න.
4) දෙවන පැරකුම්බා රජුගෙන් මෙරටට සිදු වූ සේවාවන් තුනක් සඳහන් කරන්න.
5) පළමු බුවනෙකබාහු රජුගේ සේවාවන් 3 ක් ලියන්න.
6) කෝට්ටේ යුගයේ සිදුවූ වැදගත් සිදුවීම් 3 ක් ලියන්න.
7) යාපන රාජධානිය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර 2 ක් ලියන්න.

**සැකසුම : ඩී.ටී. රුබසිංහ මයා**